# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1990 අංක 27 දරන පලාත් සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 ජූලි මස 6 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1990 ජූලි මස 06 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිල : සත 45 යි,　　තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1990 අංක 27 දරන පළාත් සභා (සංශෝධන) පනත

**[සහතිකය සටහන් කළේ 1990 ජූලි මස 6 වන දින]**

එල්. ඩී.—ඔ. 33/90

**1987 අංක 42 දරන පළාත් සභා පනත සංශෝධනය කිරීම සඳහාවූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මෙ පනත 1990 අංක 27 දරන පළාත් සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 5 වන වගන්තියෙහි අවසානයට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — 1987 අංක 42 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(3 පළාතක ආණ්ඩුකාරවරයා විසින්, ඒ පළාත සඳහා පිහිටුවන ලද පළාත් සභාවක සභාපතිවරයා වෙත කරනු ලබන දැනුම් දීමකින්, එම ආණ්ඩුකාරවරයාගේ මතයට අනුව එම පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු 4 වන වගන්තිය යටතේ එම මන්ත්‍රීවරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, දෙනු ලැබ, අත්සන් තබන ලද ප්‍රතිඥාවට නැත හොත් දිවුරුමට පටහැනි වන ආකාරයට නැත හොත් එය උල්ලංඝනය වන ආකාරයට එම දැනුම් දීමෙහි සඳහන් කර ඇති දිනයේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙරෙහි අවනතභාවය, ප්‍රකාශිතව ම ප්‍රතික්ෂේප කර ඇති බව හෝ පැහැදිලිව ම අත් හැර ඇති බව හෝ දැනුම් දෙනු ලබන අවස්ථාවක, එම දැනුම් දීමෙහි නිශ්චිතව සඳහන් දිනයේ සිට එම පළාත් සභාවෙහි මන්ත්‍රීවරයකු වශයෙන් අසුන් ගැනීමට සහ ඡන්දය දීමට එම මන්ත්‍රීවරයා නුසුදුස්සෙකු විය යුතු ය.".

3. 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— — 5අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"පළාත් සභා විසුරුවා හැරීම. — 5අ. (අ) යම් පළාත් සභාවක සම්පූර්ණ මන්ත්‍රීන් සංඛ්‍යාවෙන් අඩකට වැඩි සංඛ්‍යාවක් විසින් දැන්වීමක නිශ්චිතව සඳහන් දින හෝ ඊට ආසන්න දිනයක හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අවනතභාවය ප්‍රකාශිතව ම ප්‍රතික්ෂේප කර ඇති බව හෝ පැහැදිලිව ම අත්හැර ඇති බව හෝ 4 වන වගන්තිය යටතේ ඒ මන්ත්‍රීවරයන් විසින්, අවස්ථාවෝචිත පරිදි, දෙනු ලැබ අත්සන්

තබනු ලැබූ දිවුරුම හෝ දෙනු ලැබූ
අත්සන් තබනු ලැබූ ප්‍රතිඥාව බල
කිරීමෙන් අන්‍යාකාරයකින් ක්‍රියා
කරනු ලැබූ බව; නැතහොත්

(ආ) යම් දිනයක සිට ඒ පළාත් සභාව
සියලු අභිප්‍රායයන් සහ කාර්යයන්
සඳහා කර්තව්‍ය ඉටු කිරීම අවසන්
කර ඇති බව; හෝ

පළාතක ආණ්ඩුකාරවරයා විසින් ජනාධිපතිවරයා වෙත දැන්වීමක් කරනු ලබන අවස්ථාවක, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් දින සිට ඒ පළාත් සභාව විසිරෙන්නේ ය.".

අන්තර්කාලීන විධිවිධාන.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ වගන්තිය ක්‍රියාත්මක වීමේ හේතුවෙන් මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව වූ දිනයක සිට පළාත් සභාවක් විසිරී ඇති අවස්ථාවක, මැතිවරණ කොමසාරිස්වරයා විසින්, මෙම පනත ක්‍රියාත්මක වන දිනයේ සිට එක් සතියක කාලයක් ඇතුළත, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10 වන වගන්තියෙහි සඳහන් දැන්වීම පළ කරනු ලැබුවහොත්, ඔහු ඒ වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කර ඇති ලෙසට සළකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.